05

**Samōdhāna: The Journal of Faculty of Social Sciences and Humanities**
2015, Vol.4 (I) 59-74pp
© The Author 2015
Ed. *Tissa Weerasekara*
Pub. *Publication Section of the Faculty of Social Sciences & Humanities, Rajarata University of Sri Lanka, Mihintale.*
ssh.samodhana@gmail.com

# භාවනානුයෝගී භික්ෂූන්ගේ පරමාර්ථය සාධනයෙහිලා දායක වූ පධානඝර සම්ප්‍රදායේ ආරාම පරිශ්‍ර පිළිබඳ විමර්ශනයක්

ඉනෝජ් කෞශල්‍ය අබේනායක [1] දිලාන් පංචන ජයසිංහ[2]

**Abstract**

Sri Lanka Buddhist monastic settlements took two distinct directions. The first development that can include this designate the 'Close' type and it's located in the forest. This settlement dating back to the third century BC. Several names have been applied to this type of monastery, which are used 'Tapovana Monasteries', 'Western Monasteries' and Double platform Buildings. Mainly Archaeologists in Sri Lanka had identified this building as the Double platform buildings that has most visible architectural features. This group had used urban forest and mountain areas because they always need a quiet environment for the meditation. It is necessary to choose a meditation in accordance with the disciplinary rules. This is a type of building constructed for meditation when consulting the architectural construction of this monastery. Although there is no specific information about the methods of designing these buildings in Pali, it is evident that the objectives of the monks who lived in these places were compared with other sources.

**Key Words**: Padhanaghara, Monastery, Meditation, Architecture,

[1]*Lecturer, Department of History and Archaeology, University of Sri Jayewardenepura.*
inojmms@yahoo.com / inojabey@gmail.com
[2]*Assisstant Lecturer, Department of Pali and Buddhist, University of Sri Jayewardenepura.*
dilanpanchana@gmail.com / dilanpnchana@hotmail.com

## හැඳින්වීම

මෙරට පැරණි ආරාමික ඉදිකිරීම් ක්ෂේත්‍රයේ සුවිශේෂ ගොඩනැගිලි විශේෂයක් ලෙස පධානඝරය හැඳින්විය හැකි ය. භාවනානුයෝගී භික්ෂූන්වහන්සේලාට ස්වකීය පිළිවෙත් ඉටුකර ගැනීම උදෙසා ඉදිකර ඇති මෙම සම්ප්‍රදායේ ගොඩනැගිලි අනුරපුර යුගයේ මුල් වකවානුවේ සිට අවසාන කාලය දක්වාම පැවති බවත්, යුගය අවසානයේදී වඩාත් සංවර්ධනාත්මක ලෙස මෙම ගොඩනැගිලි සම්ප්‍රදාය ව්‍යාප්ත වූ බවත් සාහිත්‍ය හා පුරාවිද්‍යා මූලාශ්‍ර සාක්ෂි සපයයි. ලොව වෙනත් සංස්කෘතියක මෙම වර්ගයේ ගොඩනැගිලි දක්නට නොලැබෙන නිසා පධානඝර අනෙකුත් වාස්තුවිද්‍යා ගොඩනැගිලි අතර සුවිශේෂ වේ. අනුරාධපුර යුගයෙන් පසු යුගයන් හි මෙම සම්ප්‍රදායේ ගොඩනැගිලි ඉදි නොවුණු බැවින් එම යුගයෙන් පසුව පධානඝර නිර්මාණය අභාවයට ගිය බවක් පෙනී යයි. අනෙකුත් වාස්තුවිද්‍යා ගොඩනැගිලි හා සසඳන විට සංඛ්‍යාත්මක වශයෙන් මෙම සම්ප්‍රදායේ ඉදිකිරීම් සීමිතය. භාවනානුයෝගී භික්ෂූන් විෂයෙහි පැවතිය යුතු නිස්කලංක පරිසරය සෑම තැනම දක්නට නොලැබීම ඊට හේතු වන්නට ඇත. දැනට ලංකාවේ අනුරාධපුර බටහිරාරාම, රිටිගල, අරන්කැලය, වෙහෙරබැඳිගල, තන්තිරිමලය, කළුදිය පොකුණ, මානන්කන්ද, සුදු කන්ද, නුවරගල් කන්ද, අමුණුකොළ, නාගොල්ල, මාලිගාතැන්න, සීතාකොටුව, බුදුගල හා තිරියාය ආදී ස්ථාන 15 කින් පමණ මෙම වර්ගයේ ගොඩනැගිලි හමුවී ඇත.

## විමර්ශනය

### පධානඝර

පධානඝර යන්න වචනාර්ථ විග්‍රහයේ දී 'පධන්' යනුවෙන් කෙලෙස් තැවීම හෝ කෙලෙස් තවන වීර්යය යන්න අර්ථවත් වේ (සුමංගල ශබ්ද කෝෂය 1970:553). කෙලෙස් තවන වීර්යය කරන යෝගීන් වසන භූමිය පධන් භූමි වේ (එම:549). මූලික වශයෙන් බවුන් වඩනා ගෙන 'පධානඝර' නාමයෙන් හඳුන්වා ඇති බව මූලාශ්‍රය අධ්‍යයනයෙන් පෙනේ. පධානඝර යන්නට පියන්ගල් හා පතනගල් ලෙස පර්යාය නාම ද යෙදී ඇත. තත් වචනයේ නිරුක්ති පිළිබඳ ව විමසීමේදී පධාන > පදන> පතන > පියන් ලෙස ද ශෛල > සිලා > සල් > හල් > ගල් යන්න නිපන්න වී යැයි පැහැදිලි ය. එහෙත් 'හ' 'ග' වීම එතරම් සුලභව දක්නට නොලැබේ. නමුත් මහිලා> මගිල යන්න ද පාලියෙහි සීහ> සිගු ලෙස 'හ' 'ග' කාර බවට පත් තැන් සෙල්ලිපිවල ඇති බව පරණවිතාන පෙන්වාදෙයි (Paranavitana. 1933:106). ශාලා > සල > හල > ගල වශයෙන් ද ඝර> ගල වශයෙන් ද තද්භව විය හැකි බව අමරවංශ හිමියන්ගේ අදහස වේ (අමරවංශ හිමි 1996:123).

පධානඝර පිළිබඳව සඳහන් ව ඇති සාහිත්‍ය මූලාශ්‍ර අතර සමන්තපාසාදිකා විනයට්ඨකථාව, පපඤ්චසූදනී මජ්ඣිමනිකායට්ඨකථාව, පරමත්ථදීපනී ථෙරගථට්ඨකථාව, සාරත්ථදීපනී විනය ටීකාව, විමතිවිනොදනී ටීකාව, මහාවංශය,

රසවාහිනිය, පාලි බෝධිවංශය, බෝධිවංස ග්‍රන්ථි පදය, සද්ධර්මාලංකාරය හා දම්පියා අටුවා ගැටපදය ආදි කෘති ප්‍රධාන වේ.

සාරත්ථදීපනී විනයට්ඨකථා ටීකාවෙහි පධානඝරය හඳුන්වන්නේ භාවනායෙහි යෙදීමෙහි උත්සාහයට ගැළපෙන විවික්ත සේනාසනය හෙවත් වෙන් වූ සෙනසුන යන්න යි. **"පධානඝරන්ති භාවනානුයොගවසෙන විරියාරම්භස්ස අනුරූපං විවිත්තසෙනාසනං."** (**සාරත්ථදීපනී i** (විනයට්ඨකථා ටීකා), වේරගම්පිටකාණ්ඩය, 2014, ටීකා ව්‍යාපෘතිය, නැදිමාල, පි.196.) විමතිවිනෝදනී ටීකාවෙහි ද මේ නිර්වචනය ම ඉදිරිපත් කොට තිබේ. **විමතිවිනොදනී ටීකා**, Chaṭṭha Saṅgāyana Tipitaka Version 4.0 (CST4). මෙම නිර්වචනයන්ගේ කියැවෙන වෙන් වූ සේනාසන හෙවත් විවික්ත සේනාසන යන්න විමැසිය යුතු ය. භාවනානුයෝගීන් සඳහා විශේෂයෙන් වෙන් වූ කර්මස්ථානයට යෝග්‍ය වූ ස්ථාන එසේ හඳුන්වනු ලබයි. විසුද්ධිමග්ගයේ කම්මට්ඨානගහණ නිර්දේශය ආශ්‍රයෙන් මෙබඳු විවික්ත සේනාසනයක ස්වභාවය පිළිබඳ කිසියම් අදහස් මතුකර ගත හැකි ය. සිල් පිරිසිදු කරගත් යෝගාවචරයා සුපරිශුද්ධ ශීලයෙහි පිහිටා දශපලිබොධ අතුරෙන් එක පලිබොධයක් හෝ ඇත්නම් ඒවා ද දුරු කොට ගෙන කමටහන් දෙන කල්‍යාණ මිත්‍රයන් වහන්සේනමක් කරා එළැඹිය යුතු ය. එළැඹ සතලිස් කර්මස්ථාන අතුරෙන් ස්වකීය චරිතානුකූල වූ කර්මස්ථානයක් ලබා ගෙන, සමාධි භාවනාවට අයෝග්‍ය විහාරස්ථාන හැරපියා 'යෝග්‍ය විහාරස්ථානයක' වසමින්, ඉතිරි ව ඇති සුලු පලිබොධ පවා දුරු කොට භාවනාවට නියම විධි එකකුදු නො පිරිහෙළමින් භාවනා කළ යුතු ය. මෙහි එන භාවනාවට යෝග්‍ය වූ විහාරස්ථානය යන්නෙන් පධානඝරය යන්න හඳුනා ගත හැකි ය. එය සමාධි භාවනාව වඩන යෝගාවචරයාගේ ඉතිරි ව තිබෙන පලිබෝධ ධර්මයන් පවා දුරු කරවීමට සමත් ස්ථානයක් විය යුතු **ය. 1.ආවාස, 2.කුල, 3.ලාභ, 4.ගණ, 5.නවකර්ම, 6.අද්ධාන, 7.ඤාති, 8.ආබාධ, 9.ග්‍රන්ථ, 10.ඍද්ධි** යන මේවා එකී දසපලිබෝධයෝ ය. මේ එකක් එකක් පිළිබඳ වැඩි විස්තර විසුද්ධිමග්ගයේ කර්මස්ථාන ග්‍රහණ නිර්දේශයේ වේ. (**විශුද්ධිමාර්ගය**, 2004, නැදිමාල, පි.129-136) ඒ අනුව පධානඝරය කවර පලිබෝධයන්ගෙන් දුරු විය යුතු දැ'යි යන්න පැහැදිලි කර ගැනීම අසීරු නො වේ. තව ද, චරිතානුකූල කර්මස්ථානයක් දීමේ දී කර්මස්ථාන අපේක්ෂකයාගේ චරිත ස්වභාවය පිළිබඳ මනා අධ්‍යයනයක් කම්මට්ඨානාචාර්යන් වහන්සේ විසින් සිදු කරනු ලබයි. යාම් ඊම් හිඳීම් නිදීම් ආදි ඉරියව් මඟින් ද අදාළ චරිතයන් නිශ්චයන් කරගන්නා ආකාරය ආචාර්ය මතයන්හි දැක්වේ. මේ ආකාරයට කම්මට්ඨානාචාර්යයන් වහන්සේට තමන්වහන්සේ කරා පැමිණෙන කර්මස්ථාන අපේක්ෂකයාගේ ඉරියව් සියුම් ව අධ්‍යයනය කළ හැකි ප්‍රමාණවත් වපසරියක්-ඉඩකඩක් පධානඝරය තුළ තිබිය යුතු ය. ඒ සඳහා කර්මස්ථානදායකයන් වහන්සේ වැඩ සිටින ස්ථානයට හෝ කුටියට ඍජු ව දර්ශනය වන පරිදි සම්මුඛයෙහි සැකසූ විශේෂ ගෘහයක්, ශාලාවක් හෝ අන්තරාලයක් අවශ්‍යයෙන් ම තිබෙන්නට ඇත.

**'ඝර'** නාමයෙන් ගෘහය හෙවත් ගෙය යන කිසියම් ගොඩනැගිල්ලක අරුතක් යෙදුණ ද එය හුදෙක් පශ්චාත්තන ඉදිරිපත් වීමක් වන්නට පුළුවන. ජන්තාඝර, වච්ඡකුටි, චඞ්කමනසාලා ආදියට මෙන් පධානඝරය පිළිබඳ පෙළෙහි භාවිතාවක්

නැත. පධානඝරයක් අනුදත් අවස්ථාවක් හෝ එහි ස්වභාවයක් පිළිබඳ ත්‍රිපිටකයෙන් කරුණු නො ලැබේ. එබැවින් පධානඝර සංකල්පයෙහි ආදි කාලීන ප්‍රාරම්භක අවස්ථාව හැටියට සලකා ගත යුත්තේ යටකී නිර්වචනවල ඇතුළත් 'විවිත්ත සේනාසන' යන්න යි. එම විවිත්ත සේනාසනය බාගවිට ගල්ගුහාවක් ද විය හැකි ය. චේතියගිරියෙහි පැවැති පුවඟු ගුහාව පධානඝරයක් වශයෙන් භාවිත කොට ඇත.

සාරත්ථදීපනියෙහි නිගමනකථාවණ්ණනාවට අනුව මහාවිහාරයට දක්ඛිණභාගයෙහි උතුම් පධානඝරයක් වූ අතර, එහි පධානඝර යන්න **'පරිවෙණ'** නාමයෙන් ද හඳුන්වා තිබේ. චාරිත්‍රශීලයෙන් සමන්වාගත භික්ෂුසංඝයා විසින් එය සෙවුනා ලදි. (CST4). නමුත්, පධානඝර යනුවෙන් ඉහත අදහසින් පරිබාහිර අරුත් ද යෙදී ඇති අයුරු පාලි මූලාශ්‍රයාගත ව හමුවන අවස්ථා ද වෙයි. උදාහරණයක් ලෙස සාරත්ථදීපනී විනයටීකාවෙහි එයි. අපරගොයානයෙහි මහානගරයට ආදායම් ලබා දෙන, 'දොණමුඛ' නමින් හැඳින්වුණු අයබදු එකතු කරන තැන හෙවත් රේගුව හැඳින්වීම සඳහා ද පධානඝර නාමය භාවිත වී තිබේ. **"දොණමුඛන්ති ච මහානගරස්ස ආයුප්පතිට්ඨානභූතං පධානඝරං වුච්චති."** (<u>**සාරත්ථදීපනී i**</u> (විනයට්ඨකථා ටීකා), 2014, ටීකා ව්‍යාපෘතිය, නැදිමාල, පි.380.) තව ද, ධර්මාශෝක අධිරජු දවස පැවිද්දෙහි ඇලුණු උපරාජ ධුරය දැරූ තිස්ස කුමරු මහාධම්මරක්ඛිත තෙරුන් සමීපයෙහි අශෝකාරාමයේ පධානඝරයෙහි දී පැවිදි කරවන ලද බව ථෙරගාථා අටුවාවේ දසකනිපාතයේ ඒකවිහාරික තෙරුන් වහන්සේ පිළිබඳ වර්ණනාවේ සඳහන් වේ. මේ කියැවෙන පධානඝරය ප්‍රධන් වීර්යය වඩන ස්ථානයක් ද යන්න විමැසිය යුතු ය. ඇතැම් විට එය පැවිදි කිරීම් ආදි කෘත්‍යය ඉටු කරනු ලබන අශෝකාරාමයෙහි ප්‍රධාන ශාලාවක් ද විය හැකි ය. **"කුමාරො පධානඝරං ගන්ත්වා මහාධම්මරක්ඛිතත්ථෙරස්සෙව සන්තිකෙ පබ්බජි."** (<u>**පරමත්ථදීපනී (ථෙගාඅ.) i**</u>, 2012, සං. සූරියගොඩ සුමංගල මහාස්ථවිර ආදීහු, අකපුමු, නැදිමාල, පි.505.)

අපගේ භාග්‍යවතුන් වහන්සේගේ කාලයෙහි සැවැත්නුවර දෙව්රමට පිටුපස විවේකය කැමැත්තන්ට වාසස්ථාන වූ ප්‍රධාන ඝරයක්, ප්‍රධන් වීර්යය වඩන ස්ථානයක් වූ බව මැදුම්සඟි අටුවාවේ වම්මික සූත්‍රවර්ණනාවේ සඳහන් වේ. **"අම්හාකං භගවතො කාලෙ සාවත්ථියා අවිදූරෙ ජෙතවනස්ස පිට්ඨිභාගෙ එවිවෙකකාමානං කුලපුත්තානං වසනට්ඨානං පධානඝරං අහොසි."** (<u>**පපඤ්චසූදනී (මනිඅ.) ii**</u>, අකපුමු, සං. ධම්මකිත්ති සිරි ධම්මානන්ද මහාස්ථවිර, නැදිමාල, පි.102-103.) ධර්මාශෝක මහාධිරාජයාගේ සමයේ දී අස්සගුත්ත මහතෙරුන් වහන්සේ මෙත්තාවිහාරීන් අතර අගතැන්පත් ව සියලු දඹදිව භික්ෂු සංඝයාට ගුරුවරයා වී වත්තනිය සේනාසනයෙහි විසූ බවත්, ඒ වත්තනිය සේනාසනයෙහි තිස් යොදුන් පමණ වනයෙහි එක් පධානඝරයක් වූ බවත්, තෙරුන් වහන්සේ අහසෙහි සම්කඩක් එළා එහි වැඩහිඳිමින් කර්මස්ථාන දුන් බවත් චූළසකුළුදායී සූත්‍ර වර්ණනාවේ සඳහන් වේ. අස්සගුත්ත තෙරුන් වහන්සේ කල් යත් යත් පිඬුසිඟා නො ගොස් විහාරයෙහි ම හිඳ කමටහන් දුන් බවත්, මිනිස්සු විහාරයට ම ගොස් දන්දුන් බවත් සඳහන් වේ. මේ අනුව පධානඝරය ආශ්‍රිත ව සන්නිපාත ශාලා, දානශාලාදි යම්

සංකීර්ණ ආරාමික ක්‍රියාවලියකට උචිත පරිසරයක් ද මේ කාලය වනවිට ගොඩනැගී තිබුණු බව පෙනේ. ධර්මාශෝක රජු තෙරුන්වහන්සේගේ ගුණ අසා උන්වහන්සේ දකිනු කැමැති ව තෙවරක් ම පණිවුඩ යැවූ නමුත්, භික්ෂු සංඝයාට අවවාද දීම නවතා දමනු අකමැති ව රජුගේ ආරාධනය ප්‍රතික්ෂේප කළ බවත් වැඩිදුරටත් සඳහන් වේ. **"සොපි භගවති පරිනිබ්බුතෙ ධම්මාසොකරාජකාලෙ පාටලිපුත්තෙ නිබ්බත්තිත්වා පබ්බජිත්වා අරහත්තං පත්වා අස්සගුත්තත්ථෙරො නාම හුත්වා මෙත්තාවිහාරීනං අග්ගො අහොසි; ථෙරස්ස මෙත්තානුභාවෙන තිරච්ඡානගතාපි මෙත්තචිත්තං පටිලභිංසු, ථෙරො සකලජම්බුදීපෙ භික්ඛුසංඝස්ස ඔවාදාචරියො හුත්වා වත්තනියසෙනාසනෙ අවසි, තිංසයොජනමත්තා අටවී එකං පධානඝරං අහොසි, ථෙරො ආකාසෙ චම්මඛණ්ඩං පත්ථරිත්වා තත්ථ නිසින්නො කම්මට්ඨානං කථෙති, ගච්ඡන්තෙ ගච්ඡන්තෙ කාලෙ භික්ඛාචාරම්පි අගන්ත්වා විහාරෙ නිසින්නො කම්මට්ඨානං කථෙසි මනුස්සා විහාර මෙව ගන්ත්වා දානමදංසු, ධම්මාසොකරාජා ථෙරස්ස ගුණං සුත්වා දට්ඨු කාමො තික්ඛත්තුං පහිණි ථෙරො හි භික්ඛුසංඝස්ස ඔවාදං දම්මීති එකවාරම්පි න ගතොති."** (<u>**පපඤ්චසූදනී (මනිඅ.)** iii</u>, අකපුමු, සං. ධම්මකිත්ති සිරි ධම්මානන්ද මහාස්ථවිර, නැදිමාල, පි. 189.)

පපඤ්චසූදනී මැදුම්සඟි අටුවාවේ සබ්බාසවසූත්‍ර වර්ණනාවේ පධානඝර යන්න කීප අවස්ථාවක ම හමු වේ. (<u>**පපඤ්චසූදනී (මනිඅ.)** ii</u>, සබ්බාසවසුත්තවණ්ණනා, සං. ධම්මකිත්ති සිරි ධම්මානන්ද මහාස්ථවිර, අකපුමු, නැදිමාල, පි.55-81.) ලෝමසනාග තෙරුන් වහන්සේ සැගිරියෙහි පුවඟු ගුහාවෙහි පධන් වීර්යය වැඩූ ආකාරය දක්වා තිබේ. මේ අනුව චේතියගිරියෙහි පුවඟු ගුහාව භාවනානුයෝගීන්ට පධානඝරයක් ව පැවැති බව නිගමනය කළ හැකි ය. **"ථෙරො කිර චෙතියපබ්බතෙ පියංඞ්ගුගුහාය පධානඝරෙ විහරන්තො...."** (<u>**එම**</u>, පි. 72.) එම සූත්‍ර වර්ණනාවේ දී ම පධානිය තෙරුන් වහන්සේ පිළිබඳ ප්‍රවෘත්තියේ දී උන්වහන්සේ ඛණ්ඩසේල විහාරයෙහි කණිකාර නම් ප්‍රධානඝරයක අරියවංස සූත්‍රය ශ්‍රවණය කරමින් සිටිය දී සර්පදෂ්ටනයකට ගොදුරු වූ බව සඳහන් වේ. **"ථෙරං කිර ඛණ්ඩචෙල විහාරෙ කණිකාරපධානඝරෙ අරියවංසං සුණන්තං ඝොරවිසො සප්පො ඩසි...."** (<u>**එම**</u>, **පි.78.**) තව ද, එහි ම චිත්තලපබ්බතවාසී පධානිය තෙරුන් වහන්සේනමක පිළිබඳ තොරතුරු හෙළි වෙයි. උන්වහන්සේ ද එම පව්වෙහි පධන්ඝරයක වැඩ සිටින්නට ඇති බව නිගමනය කළ හැකි ය. **"න වෙධති එවං සභාවො හොති චිත්තලපබ්බතෙ පධානියත්ථෙරො විය..."** (<u>**එම**</u>, පි.74.) මේ ආකාරයට අටුවාවල එන කථාප්‍රවෘත්තීන්වල සඳහන් **'පධානිය'** නාමය කමටහන් වඩන විදර්ශනාධුර යෝගාවචර භික්ෂූන් විෂයෙහි අවිශේෂයෙන් භාවිත කරන්නට ඇති බවත්, උන්වහන්සේලා භාවනාව පිණිස ඇසුරු කළ විවික්ත සේනාසන පධානඝර නමින් හඳුන්වන්නට ඇති බවත් සිතිය හැකි ය.

සමන්තපාසාදිකා විනයට්ඨකථාවේ ද පධානඝර යන්න අවස්ථා කීපයක ම සඳහන් කොට ඇත. (<u>**සමන්තපාසාදිකා** i</u>, 2012, සං. බද්දේගම පියරතන ස්ථවිර ආදීහු, අකපුමු, නැදිමාල, පි.250.) සමන්තපාසාදිකා පාචිත්තියකාණ්ඩයේ භොජනවග්ගයේ සන්නිධිකාර සික්ඛාපදවණ්ණනාවේ ජේතවනාරාමය සමීපයෙහි ප්‍රධානඝරයෙහි

එක් ආවාසකුටියක වැඩ විසූ පෙර ජටිල සමූහයාට අයත් වූ බෙලට්ඨසීස නම් මහාස්ථවිරනමක් පිළිබඳ සඳහන් වෙයි. **"අට්ඨමසික්ඛාපදෙ-බෙලට්ඨසීසො නාම ජටිලසහස්සස්ස අබ්භන්තරො මහාථෙරො; අරඤ්ඤෙ විහරතීති ජෙතවනස්ස අවිදූරෙ පධානඝරෙ එකස්මිං ආවාසෙ වසති."** (**සමන්තපාසාදිකා ii**, 2012, සං. වැලිවිටියේ පේමරතන ස්ථවිර ආදීහු, අකපුමු, නැදිමාල, පි.617.) සමන්තපාසාදිකා මහාවග්ගඅට්ඨකථා මහාඛන්ධක වණ්ණනාවේ චීවරක්ඛන්ධක වණ්ණනාවේ ද පධානඝරයක් පිළිබඳ සඳහන් වේ. (**සමන්තපාසාදිකා iii**, 2012, සං. වැලිවිටියේ පේමරතන ස්ථවිර ආදීහු, අකපුමු, නැදිමාල, පි.831.) සමන්තපාසාදිකා චූළවග්ග අට්ඨකථා සේනාසනක්ඛන්ධකයේ සෙනාසනගාහවිනිච්ඡයෙහි ද පධානඝරයක් පිළිබඳ සහන් වේ. (**සමන්තපාසාදිකා iv**, 2012, සං. වැලිවිටියේ සෝරත ස්ථවිර ආදීහු, අකපුමු, නැදිමාල, පි.909.)

ක්‍රි.ව. 5 වන සියවසේ මෙරටට පැමිණි බුද්ධඝෝෂ හිමියන් මහාවිහාරයේ අධිපතිව විසූ සංඝපාල තෙරුන් හමු වී ඇත්තේ පධානඝරයකදී ය. (මහාවංශය 1959:37.215-236) ඒ හිමියන් සමන්තපාසාදිකාව රචනා කර ඇත්තේ අනුරාධපුර මහාවිහාරයේ මහාබෝධියට දකුණින් පිහිටි මහානිගමසාමි විසින් කරවූ මහාපධානඝරයේ වැඩවසමින් බව සඳහන් ව තිබේ. (සමන්තපාසාදිකා 1929:1056) දසවෙනි සියවසේ රචනා වූ පාලි බෝධිවංසයේ මහා විහාරය තුළ වූ පධානඝර පිළිබඳ ව සඳහන් කර ඇති අතර එය **''මෝර පාසාද පධානඝර''** ලෙසින් දක්වා ඇත. (පාලි බොධිවංසය 1890:107) දොළොස්වන සියවසේ එම ග්‍රන්ථයට කරන ලද විවරණයේ **''මොරවා පියන්ගල් වෙහෙර''** ලෙසට අර්ථ සම්පාදනය කර ඇත. (මහා බෝධිවංස ග්‍රන්ථිපදය 1985:96) සද්ධර්මාලංකාරයේ **''පතන භූමියේ රුවන් මහ පා පිහිටි තැනය''** යනුවෙන් සඳහන්ව තිබෙන්නේ පධානඝර භූමියක් බව පැහැදිලි වේ. (සද්ධර්මාලංකාරය 1953:391) රසවාහිනියේ සද්ධාතිස්ස රජුගේ (ක්‍රි.පූ. 137-119) ඇමතියකු සම්බන්ධයෙන් කෙරෙන විස්තරයක **සුදස්සන නම් පධානසාලාවක්** පිළිබඳව සඳහන්ව ඇත (රසවාහිනී 2001:162). පස්වන සියවසට අයත් ෆාහියන්ගේ දේශාටන වාර්තාවේ අභයගිරි සංඝාරාමයේ සිට ලී 40 ක් නැගෙනහිරින් පිහිටි කන්ද මත චෛත්‍ය නම් වූ (මිහින්තලය) ස්ථානයේ ධර්මකීර්ති නම් මහතෙර **''ශිලාමය පධානඝරයක''** අවුරුදු හතළිස් ගණනක් වාසය කළ බව සඳහන්ව ඇත (ෆාහියන්ගේ දේශාටන වාර්තාව 1999:96).

සෙල්ලිපි සාධක අනුව වසභ රජුට අයත් (ක්‍රි.ව. 67-111) පෙරිමියන්කුල ම ගිරි ලිපියෙහි '' සුදසන **පතන ගලහිය''** යනුවෙන් සුදර්ශන නම් පධානඝරයක් පිළිබඳව සඳහන් ය. මහාචාර්ය ටී.ජී. කුලතුංග මහත්මා සඳහන් කරන්නේ උක්ත රසවාහිනියේ සඳහන් සුදර්ශන පධානඝරය මෙය විය හැකි බවයි. බෙල් මහතා විසින් 1897 වර්ෂයේ සොයාගන්නා ලද V කාශ්‍යප රජුට අයත් (ක්‍රි.ව 980-990) මැදිරිගිරි ටැම්ලිපියේ **''මැඩිලිගිරි ඇත් වෙහෙර් පියන්ගලැ''** ලෙස ද (Wickremasingha 1928:29). IV වන කාශ්‍යප (ක්‍රි.ව. 898-914) විසින් කරවන ලද මන්නාරම් කච්චේරි ටැම් ලිපියේ **''මහවෙහෙර ඛහදුරසෙන් පියන් ගලැ බද''** (Paranavitana 1933:103). V වන කාශ්‍යප රජුට අයත් (ක්‍රි.ව. 914-923) අනුරපුර

පුවරු ලිපියේ '' **රජ මහ වෙහෙර්හි ඉසා පිරිවෙන්හි ඉසා පියන්ගල් ඉසා**'' ලෙස ත් (Wickremasingha 1912:41). IV මිහිඳු රජුට (ක්‍රි.ව. 952-972) අයත් මිහින්තලා පුවරු ලිපියේ ''**සහල් එකඩ මනා දෙපතක් ඉසා පියන්ගල් පෙරෙවැළියක්හට් දෙපයක්**'' ලෙස ද (Wickremasingha 1912:75), තිස්සමහාරාම පුවරු ලිපියේ ''**පදන්ගල**'' යනුවෙන් පධානඝර හා ඊට සපයන ලද සිව්පසය පිළිබඳ ව ද දක්වා ඇත (Paranavitana 1933:106). එබැවින් මූලාශ්‍රයන් අධ්‍යයනයෙන් පැහැදිලි වන්නේ ඉපැරණි සමාජයේ වාස්තු විද්‍යාත්මක ගොඩනැගිලි අතර පධානඝර ප්‍රධානත්වයක් ගෙන ඇති බවයි.


## පධානඝරයක වාස්තුවිද්‍යාත්මක සන්දර්භය හා කාර්යයභාරය

ලෝකයේ සකලවිධ වූ සංස්කාරයන් දුකට හේතුපත්‍ය වී අවසන ජරාවටත්, මරණයටත් පත්වන බව අවබෝධ කරගත් භාවනානුයෝගී භික්ෂූන්ගේ විහරණ ස්ථානයක් ලෙස පධානඝර හැඳින්විය හැක. (සෙනෙවිරත්න, 1994, පිට.227) මේ පිළිබඳ පර්යේෂණ කළ අය අතර එච්.සී.පී. බෙල් මහතා, ඊ.ආර්. අයර්ටන්, හෝකාර්ට්, සෙනරත් පරණවිතාන, එල්. ප්‍රේමතිලක හා සේනක බණ්ඩාරනායක හා ගාමිණී විජේසූරිය යන අය ප්‍රධානත්වයෙහි ලා සැලකිය හැකි ය. කඳුපෙත් හා වනපෙත් ආශ්‍රයකොට නිර්මාණය වූ මෙම සම්ප්‍රදායේ ගොඩනැගිලිවල ආකෘතිය එක හා සමාන ය. ආකෘතිය එක හා සමාන වුවත් කලින් කලට වර්ධනය වූ නිර්මාණ ලක්ෂණයන් පැහැදිලි ලෙස දැකිය හැක. කැට ගලින් චාම් කැපූ ගලට ද අනතුරුව සිංහල වාස්තු විද්‍යාවට ආවේණික වක්‍ර රේඛාමය ලීස්තර වැඩ සහිතව ද පධානඝරවල නිර්මාණ ලක්ෂණයන් ප්‍රාදේශීය අනන්‍යතා ද ඉස්මතු කරමින් වර්ධනය වී ඇත (Bandaranayaka. S. 1974). විහාරාරාමවල ප්‍රධාන වශයෙන් විවෘත (Open) හා සංවෘත (Closed) ලෙස වර්ග දෙකක් යටතට ගොනු කළ හැක. මෙහි දෙවන වර්ගයට පධානඝර අයත් වේ. මෙම ගොඩනැගිලි ප්‍රධාන වශයෙන් ආගමික වත් පිළිවෙත් සඳහා ම යොමුව තිබීම ඊට හේතුව වේ (Wijesuriya 1998:45). දැනට සොයාගෙන ඇති පැරණිත ම පධානඝරය ලෙස සැලකෙන වෙහෙරබැඳිගල පධානඝරය එච්. හෝකාර්ට් මහතා විසින් ක්‍රි.ව. 3-4 කාලයට අයත් සේ දක්වා ඇතත් සේනක බණ්ඩාරනායක මහතා එය ක්‍රි.ව. 5-6 සියවස් අතරට වැටෙන සඳහන් කර ඇත (Bandaranayaka S., 1974.102). අනුරාධපුර බටහිරාරාම සහ රිටිගල පධානඝර ක්‍රි.ව. 7-10 කාල වකවානුවට අයත් වේ. එම පධානඝර මෙම සම්ප්‍රදායේ දියුණුත ම ලක්ෂණ පෙන්නුම් කරයි.

තපෝවන පරිශ්‍රයක පිහිටි පධානඝරයක ප්‍රධාන වශයෙන් කොටස් දෙකක් දැකිය හැක. ඒ නිසාවෙන් එච්.සී.පී.බෙල් මෙය Double Platform Building ලෙස හඳුන්වා ඇත. කුඩා චතුරස්‍රයක් ලෙස පෙනෙන කොටස ''**කුටිය**'' ලෙස ද විශාල චතුරස්‍රය ''**මණ්ඩපය**'' ලෙස ද මූලික ව හඳුනාගැනේ. බොහෝවිට මෙම කොටස් දෙක එකිනෙකට ළං වූ පර්වත දෙකක් සම්බන්ධ කර හෝ පාෂාණ උද්ගතයක් මනා ලෙස ඔපමට්ටම් කර නිමවා ඇත. එම ගොඩනැගිලි දෙක සම්බන්ධකොට තනි ගලින් කළ ගල් පුවරුව පාලමක් ලෙස සම්බන්ධ වේ. එබැවින් එක්

කොටසකින් අනෙක් කොටසට ගමන් කළ හැකි ය. කුටිය ලෙස සැලකෙන කොටසෙහි පැහැදිලි ව දකිය හැකි බිඳුණු කුලුණු නිසාවෙන් එය බිත්තිවලින් හා වහලයකින් සමන්විත වූ බව පැහැදිලි වේ. තපෝවන භික්ෂූන්ගේ වාසය සඳහා මෙම කුටි භාවිත කරන්නට ඇති බවට බටහිරාරාම, අරන්කැලය හා රිටිගල පධානඝර අධ්‍යයනයෙන් පැහැදිලි වේ.

මුල්කාලීනව පදන් භූමි වල පිහිටි පියන්ගල් සඳහා ගෘහයක් නොතිබෙන්නට ඇත. මෙම ද්විමාලක ගොඩනැගිල්ලේ සැලැස්ම එකිනෙකට ළංව පිහිටි ගල්පර දෙකක් යාකෙරෙන ගල් පතුරකින් සම්බන්ධව ඉදිකරන්නට ඇති බව විශ්වාස කෙරේ. පසුකාලීනව මෙම පදන් භූමිවල උපයෝගිතාව දිනෙන් දින වර්ධනය වීම සහ රාජානුග්‍රහය ඉතා ඉහළින් ලැබීම හේතුකොට ගෙන වාස්තු විද්‍යානුකූලව කැපූ ගලින්, ගෘහයක් සහිතව පධානඝර නිර්මාණය විය. මෙහි ගෘහයක් එක් වූයේ කුටිය නම් කොටසට ය. අනෙක් කොටස විවෘත මණ්ඩපයක් සේ ඉදිවන්නට විය. නමුත් මෙය තවදුරටත් විමසිය යුත්තකි.




පධානඝරයක සැලසුම

ජ්‍යෙෂ්ඨ භික්ෂූන් වහන්සේලා විසින් නවක භික්ෂූන් උදෙසා භාවනාවට සුදුසු කමටහන් ලබාදීම හා ඒ පිළිබඳ ව කිසියම් ගැටලුවක් ඇති වූ කල ඒවාට උපදෙස් සැපයීම සඳහා දෙපාර්ශවය අතර මුණු ගැසීම සිදුවන්නේ මෙම විවෘත මණ්ඩපය තුළ ය. විශේෂයෙන් නවක භික්ෂූන් හමුවේ ඇතිවන ගැටලු නිරාකරණය කර ගැනීම සඳහා ඔවුන් ආචාර්ය භික්ෂූන් වසන කුටිය තුළට නො යෑම සිරිතකි. ඒ සඳහා සුදුසු ම ස්ථානය විවෘත මණ්ඩපය යි. නවක භික්ෂූන්ට විවෘත මණ්ඩපයේ

ඉදිරිපසින් ඒ මතට පිවිසිය හැකි වන අතර ආචාර්යවරයාට කුටියේ සිට ගල් පුවරුව හරහා විවෘත මණ්ඩපයට පැමිණිය හැකි ය. විවෘත මණ්ඩපයේ පිටුපස ගල් පුවරුවට සම්බන්ධවන ස්ථානයේ දෙපසින් යොදා ඇති පියගැට පෙළවල් දෙකකි. එම පියගැට පෙළවල් ආචාර්යවරයා හමුවීමට පැමිණෙන ශිෂ්‍ය භික්ෂූන් කමටහන් හෝ උපදෙස් ලබා මණ්ඩපයෙන් ඉවත්ව යන විට ආචාර්යවරයාට පිටුනොපා මණ්ඩපයෙන් බැහැර වීමේ අරමුණ පෙරදැරිව යෙදුවා විය හැකිය. සියලුම පධානඝරවලට පොදු වූ මෙම ලක්ෂණය (කුලතුංග ටී.ජී., 1996:34).

පධානඝර පරිශ්‍රය කමටහන්ගෙන භාවනාවට පිළිපන් යෝගාවචරයාගේ සිත් සතන් තම අරමුණෙහි රඳවා ගැනීමට සුදුසු ලෙස සකස් වී ඇතිදැයි විමසිය යුත්තකි. පුරාවිද්‍යාත්මක සාධක අනුව දැනට ලංකාවේ පධානඝර පරිශ්‍ර පිහිටා ඇත්තේ නගරයට නොළං නොදුරු වන ගත පරිසරයකය. රිටිගල. අරන්කැලය, වෙහෙරබැඳිගල, නාගොල්ල, කළුදිය පොකුණ ආදී ස්ථාන ඊට සුදුසුම උදාහරණ වේ. විශුද්ධි මාර්ගයේ කමටහන් වැඩීමට නුසුදුසු විහාර අටලොසක් ගැන පෙන්වා දී ඇත (විශුද්ධි මාර්ගය 1960:181). ඒවා නම් **මහාවිහාර, අභිනව විහාර, දිරාපත් විහාර, මහාමාර්ගාසන්න විහාර, පැන්කෙම් ඇති විහාර, පලා කොළ ඇති විහාර, මල් සහිත විහාර, ඵල සහිත විහාර, ජනප්‍රාර්ථනීය විහාර, නගරාශ්‍රිත විහාර, දැව ඇති විහාර, ක්ෂේත්‍රාසිත විහාර, විසභාග පුද්ගලයින් ඇති විහාර, සමුද්‍ර තීර ඇසුරු කළ විහාර, ප්‍රත්‍යන්ත ඇසුරුකළ විහාර, රාජ්‍ය සීමා ඇසුරු කළ විහාර, සප්පාය නැති බව හා කල්‍යාණ මිත්‍රයින් නැති බව යන අංගයන්ගෙන් සමායුක්ත විහාරයන්** වේ. ඉහත සඳහන්කරන ලද ගුණාංග පධානඝර විහාරාරාම පිළිබඳ සෘජුවම සඳහන් කරන කරුණු නොවූවත් ඒ ආශ්‍රයෙන් අපට හමුවී ඇති පුරාවිද්‍යා පරිශ්‍ර විමසීමට ලක් කිරීම වඩා වැදගත්වනු ඇත.

මෙහි සඳහන් **මල් සහිත, ඵල සහිත, පලාකොළ සහිත, දැව සහිත, අභිනව විහාර, දිරාපත් විහාර** ආදී භෞතික සාධකයන් තපෝවන ආරාම සඳහා නුසුදුසු බව නිගමනය කර ඇත ද ඒ පිළිබඳ වර්තමානයේ ඇති සාධක මත තීරණයකට එළඹීම යෝග්‍ය නොවනු ඇත. ඇතැම් සාධක විද්‍යාත්මක දත්ත මත නිගමනය කිරීම වඩා යෝග්‍ය වේ. වැඩි වශයෙන් මල්, ඵල සහිත ශාක ගහණයක් දක්නට නැතත් රුස්ස ගස් මගින් චණ්ඩතාපය වළක්වන ශාක ගහණයකින් සැදුම් ලත් වියනක් පදන් ආරාමයන්හි පැවති බව කිවයුතුය. එම සාධකය මත පදන් ආරාම තපෝවනාරාම ලෙස ව්‍යවහාරයේ පැවත එනු ඇත. මනස හා කය සංවරව පවත්වාගැනීමට වනස්පතීන් උපකාරී වූ බව ථෙර හා ථේරී ගාථාවලින් මොනවට පසක් වේ. එබැවින් පදන් ආරම වන ගහනයෙන් යුකත් වීම බවුන් වඩන යෝගාවචරයන්ට සිත සනසන කදිම ඖෂධයක් වූ බව මූලාශ්‍රගත කරුණු හා සැසඳීමේදී අවබෝධවනු ඇත.

පධානඝර ස්ථානගතවීම අනුව **නගරාසන්න, මහාමාර්ගාසන්න, කෙත්වතු ආසන්න, සමුද්‍රතීර ආසන්න, රාජ්‍ය සීමා ආසන්න විහාර** නොවූ බව ද පෙනේ. රිටිගල. මානක්කන්ද, නාගොල්ල, වෙහෙරබැඳිගල ඊට හොඳම උදාහරණ වේ. විශුද්ධි මාර්ගයේ දැක්වෙන ආකාරයට **මහාවිහාර** භාවනානුයෝගියාට දෝෂ ඇති බව

පෙන්වා දී ඇතත් අනුරාධපුරය මහාවිහාර භූමියෙහි චංකමනයක් සහිත පධානඝරය සලකුණු මෑතකදී සිදුකළ පුරාවිද්‍යා කැණීම් මගින් අනාවරණය කරගන්නා ලදී. මහාවිහාර භූමි පරිශ්‍රයේ පිහිටි, වර්තමානයේ රුවන්වැලි සෑ සහ ථූපාරාම විහාර භූමි යා කෙරෙන පෙත්මග ආසන්නයෙහි දැකිය හැකි චංකමනයකින් සමන්විත මෙකී ගොඩනැගිල්ල පධානඝරයක් බව විද්වද් මතයයි. සාහිත්‍ය මූලාශ්‍ර සාධක අනුව මහාවිහාරයෙහි පධානඝරයක් පිහිටි බව සඳහන් වේ.(සමන්තපාසාදිකා 1929:1056, මහාවංශය 1959:37.215-236) පුරාවිද්‍යාත්මක සාධක අනුව මහාවිහාර භූමියෙහි එවැනි පධානඝරයක් පිහිටා තිබූ නමුත් එය පධානඝර කිහිපයකින් යුක්ත ඊටම වෙන්වූ පරිශ්‍රයක් නොවූ බව පැහැදිලිය. එසේම අභයගිරි සහ ජේතවන මහා විහාර තුළ පධානඝර දැකිය නොහැකිය. එකී ගොඩනැගිලි දැකිය හැක්කේ අනුරාධපුරයෙන් බටහිර වනගත පෙදෙසක වේ. එබැවින් පධානඝර පිහිටුවීම මූලාශ්‍රගත කරුණු හා සැසඳීමේදී බද්ධතාවක් දැකිය හැකිය.

මින් අනතුරුව විමසිය යුතුව ඇත්තේ එකී ගොඩනැගිලි භාවනානුයෝගීන්ට සුදුසු පරිදි නිමකර තිබුණේ ද යන්නයි. බාහිර ලක්ෂණවලට අනුව අනෙකුත් විහාරාරාම වලට වඩා කිසියම් වෙනසක් දැකිය හැකිය. එනම් මෙම ගොඩනැගිලි හා ඊට සම්බන්ධ කර ඇති මුරගල්, කොරවක්ගල් හා සඳකඩපහණ ආදියෙහි කැටයම් කිසිවක් නො තිබීම යි. භික්ෂූන්ගේ නිතර ඇස ගැටෙන බාහිර පරිසරය බවුන් වඩනට සුදුසු පරිදි හැසිරවීම අරමුණු කොට බාහිර අලංකරණයට යොමු නොවූ බව පෙනේ. කැටයම් දක්නට ඇත්තේ කැසිකිලි හා වැසිකිලි ගල් වල පමණි. එම කැටයම් අතර වාමන රූප, කුවේර රූප, සත්ව රූප, විමාන හා මාළිගා නිරූපණය වේ. ජීවිතයේ අනිත්‍ය බව, කම් සැපයෙහි පිළිකුල් බව භික්ෂූන්ගේ සිතෙහි අභිප්‍රේරණය කිරීම අරමුණු කොට එම රූප වැසිකිලි හා කැසිකිලි තුළ කැටයම් කරන්නට ඇත. එබැවින් භාවනානුයෝගියාට සුදුසු පරිසරයක් එකී ගොඩනැගිලි තුළින් ද විද්‍යමානකර ඇත.

පධානඝර ආශ්‍රිතව භික්ෂූන්ගේ ප්‍රයෝජනය උදෙසා ස්වභාවික හා කෘතිම දිය රඳවන දැකිය හැක. බවුන් වඩන භික්ෂූන් ගේ නිරාමිස ප්‍රීතිය උදෙසා වන කදිම ඖෂධයක් වන එම ජල රැඳවුම් කළුදිය පොකුණ හා තන්තිරිමලය පරිශ්‍රයන්හි දැකිය හැක. කටුක පරිසරයක ඉදිකර ඇති මෙම ආරාමවල වාසය කරන භික්ෂූන්ගේ කායික මෙන්ම මානසික අවශ්‍යතා උදෙසා කෘතිම ජල රැඳවුම් මගින් ඉටුකර ගත් මෙහෙය වඩා වැදගත් වූ බව බටහිරාරාම පධානඝර පරිශ්‍රයේ දැකියහැකි එකී ගොඩනැගිලි හා බද්ධකොට නිමවා ඇති ජල රැඳවුම් මගින් පැහැදිලි වේ. භෞතික පරිසරය නිසි ලෙස කළමණාකරණය කර භාවනානුයෝගීන්ට සුදුසු මානසිකත්වය ළඟා කර ඇති බව ඉහත කරුණු විමසීමෙන් පැහැදිලි වේ.

මෙම ද්විත්ව ගොඩනැගිලි හා බද්ධ දිය අගල් සෑම පධානඝරයකම දැකිය හැකි පොදු ලක්ෂණයක් වේ. කර්කශ පරිසරයක දිවි ගෙවන භාවනායෝගී භික්ෂූන්ට එමගින් සිසිලසක් සැලසෙන අතර, රාත්‍රියට වන සතුන්ගෙන් වන උවදුරු ද

මඟහරවා ගැනීමේ හැකියාවක් ඇත. බටහිරාරාම සංකීර්ණයේ ද්විත්ව ගොඩනැගිල්ලට යාබද ව ඇති දිය අගල් වඩා නිර්මාණශීලී ය. ඇතැම් තැනක ඒවා පොකුණු ආකාරයෙන් දිස්වේ. පතුලට බැසීමට පියගැට පෙළක් ද නිර්මාණය කර ඇත. දිය අගල පාරිශුද්ධත්වයේ සංකේතයක් ලෙස ඉදිකරන ලද්දක් දැ යි සිතීමට ද හැකි ය. තිරියාය විහාරයට අයත් පධානඝර දෙකක් පැහැදිලිව දැකිය හැකි වන අතර ඉන් එක් පධානඝරයක භික්ෂූන්වහන්සේ වැඩ සිටි කුටිය කොටසට අයත් ජල රැඳවුම් කොටසේ ක්‍රි.ව. 8-9 සියවසට අයත් අක්ෂර ලක්ෂණ වලින් යුත් පේළි 3 ක සෙල්ලිපියක් හමුවී ඇත.

1. මෙ සීමාබද්
2. වහනෙ දි කැඩු
3. යුන් නොවසනු

මෙය අර්ථ ගන්වන මහාචාර්ය කරුණාසේන හෙට්ටිආරච්චි මහතා **මෙම සීමාවට අයත් වානෙහි ජලය නවතාලන්නවුන් (ආරාමයෙහි) වාසය නොකරනු** යන්න දක්වයි.

මෙම ලිපියට අනුව පධානඝරයට නොකඩවා ජලය සැපයිය යුතු බවත් එය නවතාලන්නන් ආරාමයෙහි වාසය නොකල යුතු බවත් නීති පනවා ඇත. ඒ අනුව මෙම ලිපියෙන් පධානඝර පිළිබඳ කරුණු කීපයක් අනාවරණය කරගත හැකිවේ. එනම් පධානඝරයේ පසුපස කොටස පැහැදිලිව ජල සීමාවක් ලෙස ක්‍රියාත්මක වුනු බව හා එම සීමාවට හානි කරන්නන් ආරාමයෙන් නෙරපා හැරීමට බලය තිබූ බවත්ය. මෙම ජල සීමාවට ජලය ගෙන එන ජල පිහිල්ලක් පධානඝරයේ නැගෙනහිර සීමා බැම්මට සම්බන්ධව දැකගැනීමට හැකියාව ඇත. විශේෂ වූ පැහැදිලි ජල මාර්ගයක් මෙම ජල පිහිල්ලට සම්බන්ධව දැනට දැකගත නොහැකිය. එබන්දක් අතීතයේදී තිබී විනාශ වූයේ ද එසේ නැතහොත් මෙම පාධානඝරයට ඉහළින් පිහිටා ඇති පධානඝරයේ භූමි සීමාවට එකතු වන ජලය ක්‍රමානුකූලව මෙම ජල පිහිල්ල හරහා ජල රැඳවුමට එක් වූයේ දැයි සිතිය යුතුය. මෙයින් පෙනෙන්නේ මේ පධානඝරයේ ජල සැපයුම අත්‍යවශ්‍ය සාධකයක්ව පැවත බවයි. ඇතැම්විට මෙම ජල පහර වෙනත් යම් යම් කටයුතුවලට යොදාගැනීම හෝ අවහිර කිරීම හේතුවෙන් මෙම නීතිය පනවන්නට ඇත.

තිරියාය පධානඝර ගොඩනැගිලි ස්ථානගත කර ඇත්තේ කඳු මුදුනක එක් පාර්ශවයකය. එහි ස්වාභාවික පාෂාණ උද්ගත ද එමටය. එසේම තද හිරු එළිය ද වසරේ වැඩි කළක් නොඅඩුව ලැබෙන එම ප්‍රදේශයේ වර්ෂාව ද දුලභය. කඳු මුදුනක ජල රැඳවුම ද පහසු නොවේ. එබැවින් මෙවැනි පරිසරයක පධානඝරයේ මූලික අවශතාවක් වූ භික්ෂූන් වහන්සේලා වැඩ සිටින 'කුටියට බද්ධ වූ දිය අගලට නිරතුරු ජලය සැපයීමට විහාර නීතිය බල පවත්වන්නට ඇති බව නොඅනුමානය. එබැවින් ජලය නැමැති සාධකය පධානඝර හා බද්ධවූ බව පැහැදිලිය.

ඉහත සඳහන් කළ භෞතික සාධකයන් නිසිලෙස පවත්වාගෙන ඇති පධානඝර පරිශ්‍රයේ ප්‍රධාන ගොඩනැගිල්ල හා බැඳුණු වත් පිළිවෙත් පිළිබඳ මූලාශ්‍රගත සාධක නොමැත. නමුත් අවශේෂ පුරාවිද්‍යා ස්මාරක හා සාහිත්‍ය මූලාශ්‍ර නිසිලෙස අධ්‍යයනය කිරීමෙන් මෙම ගැටළුවට පිළිතුරු සෙවිය හැකිය.

පධානඝරයේ විවෘත මණ්ඩපය තුළ විසුද්ධි මාර්ගයේ දක්වෙන භාවනා ක්‍රම අතුරින් එකක් වන තෙජෝ කසිනය පිරීමට අවකාශ ඇත. එහි විස්තර වන පරිදි ''***සිනිඳු වූ හර ඇති දර පලා වියලා ගෙන එය කැබලි කොට සුදුසු රුකක් මුලට හෝ මණ්ඩපයට හෝ ගොස් පාත්‍ර පිසින ආකාරයෙන් රැස්කොට දැල්විය යුතු ය. පසුව හුණ පැදුරක හෝ සමක හෝ වස්ත්‍රයක එක් වියත් සතරඟුල් පමණ වූ සිදුරක් සාදා එය දැල්වෙන ගින්න අභිමුඛයේ තබාගෙන හිඳගෙන සනව පවත්නා ගිනිදැල්ලෙහි නිමිත්ත ගත යුතු ය.***'' (විශුද්ධි මාග්ගය. පිට. 256) විශුද්ධිමග්ගයෙහි දක්වෙන අනෙක් කසින භාවනා ක්‍රම කුටිය තුළ සිට සිදු කළ හැකි ය. උදාහරණයක් ලෙස ආලෝක කසිනය පිළිබඳ දැක්වෙන විග්‍රහයෙන් ඒ බව පසක් වේ.''***ආලෝක කසිනය වඩන භාවනානුයෝගියා බිත්ති සිදුරකින් හෝ තල්කොලයකින් හෝ වා කවුළුවකින් සූර්යාලෝකය නැතහොත් චන්ද්‍රාලෝකය පිවිස බිත්තියෙහි හෝ භූමියෙහි පතිත වන වෘත්තාකාර ආලෝක තැටිය නිමිත්ත වශයෙන් ගත යුතුය. එම කාර්යයද දුෂ්කර කල්හි කලයක් තුළ පහනක් දල්වා එහි මුවවසා කලයේ සිදුරක් කොට ඉන් නික්මෙන ආලෝකය භාවනාගෘහයෙහි බිත්තියට එල්ල වන සේ තබා බිත්තිය මත අලෝක රවුමක් ඇති කොට ගෙන එය එළිය එළිය කියා හෝ ආලෝකය, ආලෝකය කියා හෝ භාවනා වැඩිය යුතුය.***'(විශුද්ධි මාර්ගය. 1914:131) අභයගිරි ස්තූපයේ සලපතල මළුවෙන් සොයා ගත් ක්‍රි.ව.9-10 සියවස් නියෝජනය කරන පදර ලිපියේ අභයගිරි විහාරස්ථානයේ වැඩවෙසෙමින් පිණ්ඩපාත ධූතාංගය සමාදන් ව ආලෝක කසිනය වැඩූ භික්ෂූන් වහන්සේ නමක් පිළිබඳ තොරතුරු සඳහන්ව ඇත. (හෙට්ටිආරච්චි කරුණාසේන, 2010) කෙසේ වෙතත් මෙම කුටිය හා මණ්ඩපය තුළ කුමන වූ වත් පිළිවෙත් සිදු කලාද යන්න තවදුරටත් විමසිය යුත්තකි.

කෙසේ වෙතත් පධානඝර සම්ප්‍රදායේ ගොඩනැගිලි පිළිබඳ පවතින මත විවිධාකාර ය. හුදෙක් සාහිත්‍ය හා පුරාවිද්‍යා මූලාශ්‍ර ඔස්සේ පධානඝරයක ඇවතුම් පැවතුම් පැහැදිලි ලෙස විග්‍රහ නොවීම එයට මූලික හේතුව වී ඇත. වල්පොළ රාහුල හිමිපාණන් ඒ පිළිබඳව මෙසේ අදහස් එක්කරයි. (රාහුල හිමි, වල්පොල 1966.පිට.164)

***'' පධානඝර යන නමින් පෙනෙන්නේ මුලදී මෙය භාවනා කිරීමට පාවිච්චි කළ ගෙයක් බවයි. එහෙත් පසු කාලයක දී එහි විශේෂ අර්ථය යටපත් වී නම පමණක් ඉතිරිවිය. පසු කාලයක දී පධානඝරය ආරාමයේ නායක ස්ථිවරයන්ගේ ලැගුම් ගෙය වන්නට ඇත. බුද්ධඝෝෂාචාර්යයෝ මහා විහාරයේ මහාපධානඝරයේදී සංඝපාල නායක ස්ථවිරයන් බැහැදුටු යහි සඳහන් වීමෙන් මේ බව සිතා ගත හැකි ය. උත්සව අවස්ථාවලදී මිනිසුන් තමන් ම පිරිවෙන් හා පධානඝර තුළට පිවිස තවත් භික්ෂූන් සියයක් වුවත් කැටුව වඩින ලෙස ත්‍රිපිටකාචාර්ය ස්ථිවිරයන්ටත්***

***ධර්මකථික ස්ථවිරයන්ටත් ආරාධනා කරන බව සමන්තපාසාදිකා ව සඳහන් කරයි. ඇතැම් විට පධානඝරය තුළ ම ධර්මදේශනා පවත්වන ලදි. පධානඝරය පාවිච්චි වූයේ භාවනාවට පමණක් නම් එහි ගොඩවැදී කථා බහ කිරීමෙන් හා ආරාධනා කිරීමෙන් භාවනාවට බාධා කරන්නට පිටස්තර අයට ඉඩක් ඇතැයි සිතිය නො හැක.''***

මේ අකාරයෙන් විමසන කල පධානඝර අනෙකුත් වාස්තු විද්‍යා ගොඩනැගිලි අභිබවා ගැඹුරු වූ ආගමික සංකල්ප ඉස්මතු කිරීමට දායක වූ බවක් පෙනේ. කෙසේ වෙතත් පධානඝර කාලය සමග විකාශනයේදී පොදු ආකෘතියෙන් එතරම් බැහැර වීමක් දක්නට නැතත් වත් පිළිවෙත් සිදුකිරීම අරඹයා කිසියම් වෙනස්වීමක් සිදුවී ඇති බව රාහුල හිමියන් විසින් පෙන්වා දී ඇත. හුදෙක් එය සනාථ කිරීමට බොහෝ මූලාශ්‍ර නොමැති නිසාවෙන්, සුවිශේෂී අවස්ථාවල පමණක් මූලික පිළිවෙතට හානියක් නොවන ලෙස ධර්මදේශනා ආදිය සිදු කළ බව කිව හැකිය. මේ ආදී කරුණු සැලකිල්ලට ගත් කල පධානඝර මෙරට වාස්තු විද්‍යා ඉදිකිරීම්හි විශිෂ්ටත්වය පිළිබිඹු කරන ගොඩනැගිලි විශේෂයක් බව පෙන්වා දිය හැකිය.

## නිගමනය

පධානඝර සම්ප්‍රදයයේ ගොඩනැගිලි අනුරාධපුර යුගයේ ආරම්භයේ සිට අවසාන කාලය දක්වා පැවතෙමින් අභාවයට පත් විය. සංකීර්ණ ආගමික සංකල්ප එක්තැන් වූ සුවිශේෂී කලා නිර්මාණයන්ගේ එකතුවක් ලෙස ගැනෙන මෙම සම්ප්‍රදායේ ගොඩනැගිලි ආරාමික වාස්තු විද්‍යාවට නව අරුතක් එක් කිරීමට සමත්කමක් දැක්වූවකි. සුවිසල් ශිලා කර්මාන්තයේ චාම් බව, සරල බව විදහා දැක්වෙන පොදු ආකෘතියකින් සමන්විතවූ මෙහි  නිර්මාණ තාක්ෂණය පිටුපස භික්ෂූන් වහන්සේලා උන් බව නම් කිව යුතුමය. හික්මවීම හා හික්මීම යන උදාර ගුණයන්ගෙන් සමන්විත වූ ලක් වැසි තෙරුන්වහන්සේලා තම ආගමික අරමුණු සිත් පිත් නැති පර්වතයන් හා බද්ධ කොට කලා නිර්මාණයන් බවට පරිවර්තනය කිරීමට සමත් විය. පෙළ දහමේ පිළිවෙත් මත සමාජ ආගමික මුහුණුවරට එබිකම්කරමින් නිර්වාණය සාක්ෂාත් කරගැනීමට දරන උත්සාහය මොනවට හුවා දක්වන මෙම පදන් භූමි නිරාමිස ප්‍රීතිය ජනනය කරවන බව නිර්මාණ තුළින් පැහැදිලි වේ.

හුදෙක් මෙම ගොඩනැගිලි අරඹයා ගැණෙන වත් පිළිවෙත් පෙළ දහමෙහි පැහැදිලිව නොදැක්වෙතත් වාස්තු විද්‍යා සන්දර්භය විමසන කල එයට ද පිළිතුරක් එක් කළ හැකිය. මුල් කාලීනව භාවනානුයෝගී යෝගාවචරයන්ගේ භූමියක් වූ මෙය සමාජ සංකීර්ණත්යත් සමග නිරාමිස ප්‍රීතිය විඳිනට අදහස් කරන බුද්ධිමත් ජනතාවගේ ද තොතැන්නක්  වූ බවට මූලාශ්‍රගත සාධක තුළින් පැහැදිලි  වේ. මෙවැනි සුවිශේෂී වූ කරුණු එක්තැන් වූ පධානඝර සම්ප්‍රදාය ආරාමික වාස්තු විද්‍යාවේ උත්කෘෂ්ට නිර්මාණයක් වේ.

## ආශ්‍රිත ග්‍රන්ථ


අමරවංස හිමි කොත්මලේ, (1966), **ලක්දිව සෙල්ලිපි**, ඇම්.ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ.

කුලතුංග ටී.ජී. (1996), **අභයගිරි පර්යේෂණ**, මධ්‍යම සංස්කෘතික අරමුදල, කොළඹ.

කුලතුංග ටී.ජී. (1996) ''මහාවිහාර සීමාව හා පූජනීය ස්ථාන පිහිටීම'', **අනුමෝදනා**, අනුරාධ සෙනෙවිරත්න උපහාර ලිපි සංග්‍රහය, සංස්. මහාචාර්ය එම්. සෝමතිලක, එච්.එම්.ඩී.ආර්. හේරත්, එස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ.

**දම්පියා අටුවා ගැටපදය**, (1960), (සංස්). මැදඋයන්ගොඩ විමලකිත්ති හිමි, නැහින්නේ සෝමින්දස්ථවිර, ඇම්.ඩී. ගුණසේන සමාගම, කොළඹ.

**දීපංවංශය**, (1970), (පරි). කිරිඇල්ලේ ඤාණවිමල හිමි, ඇම්.ඩී.ගුණසේන සහ සමාගම, කොළඹ 11.

**පපඤ්චසූදනී** (මනිඅ.) ii, අකපුමු, සං. ධම්මකිත්ති සිරි ධම්මානන්ද මහාස්ථවිර, නැදිමාල.

**පපඤ්චසූදනී** (මනිඅ.) iii, අකපුමු, සං. ධම්මකිත්ති සිරි ධම්මානන්ද මහාස්ථවිර, නැදිමාල.

**පපඤ්චසූදනී** (මනිඅ.) ii, සබ්බාසවසුත්තවණ්ණනා, සං. ධම්මකිත්ති සිරි ධම්මානන්ද මහාස්ථවිර, අකපුමු, නැදිමාල.

**පරමත්ථදීපනී** (ථෙගාඅ.) i, 2012, සං. සූරියගොඩ සුමංගල මහාස්ථවිර ආදීහු, අකපුමු, නැදිමාල.

**පාලි මහා බෝධිවංශය**, (1890), සංස්. එච්.ඩබ්.ගුණවර්ධන, ලක්රිවි කිරණ මුද්‍රණාලය

**මහාවංසය ප්‍රථම භාගය**, (1959), (පරි), ශ්‍රී සමුංගල හිමි, බටුවන්තුඩාවේ දේවරක්ෂිත,එස්.ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ.

**මහාවංසය ද්විතීය භාගය**, (1912), (පරි). ශ්‍රී සුමංගල හිමි, බටුවන්තුඩාවේ දේවරක්ෂිත, රජයේ මුද්‍රණාලය, කොළඹ.

**මහාබෝධිවංස ග්‍රන්ථි පදය**, (1985), (සංස්). ගතාරේ ධර්මපාල, පියසිරි ප්‍රින්ටිස් නුගේගොඩ.

**රසවාහිනිය**, (2001), (සංස්). පණ්ඩිත රංජිත් වනරතන, සමයවර්ධන මුද්‍රණාලය, කොළඹ 10.

විමුත්තිමග්ග, (1963), (සංස්). **ගල්කැටියාගම සිරි රතනජෝති සහ කරල්ලියැද්දේ සිරි රතනපාල,** කොළඹ.

**විශුද්ධි මාර්ගය**, (1959), (පරි). ඒ.පී.ද. සොයිසා. ධර්මසමය මුද්‍රණාලය, මරදාන, කොළඹ.

**සද්ධර්මාලංකාරය**, (1953), (සංස්). කළුතර සාරනන්ද ස්ථවිර, රත්නාකර පොත් වෙළඳ ශාලාව, කොළඹ.

**සමන්තපාසාදිකා** i, 2012, සං. බද්දේගම පියරතන ස්ථවිර ආදීහු, අකපුමු, නැදිමාල.

**සමන්තපාසාදිකා** ii, 2012, සං. වැලිවිටියේ පේමරතන ස්ථවිර ආදීහු, අකපුමු, නැදිමාල.

**සමන්තපාසාදිකා** iii, 2012, සං. වැලිවිටියේ පේමරතන ස්ථවිර ආදීහු, අකපුමු, නැදිමාල.

**සමන්තපාසාදිකා** iv, 2012, සං. වැලිවිටියේ සෝරත ස්ථවිර ආදීහු, අකපුමු, නැදිමාල.

**සාරත්ථදීපනී i** (විනයට්ඨකථා ටීකා), වේරඤ්ජකාණ්ඩය, 2014, ටීකා ව්‍යාපෘතිය, නැදිමාල,

ගුණවර්ධන රණවීර, (1993), **සිවුර හා නගුල**, සමාජ විද්‍යාඥයන්ගේ සංගමය, කොළඹ 05

රාහුල හිමි වල්පොල, (1966), **ලක්දිව බුදුසමයේ ඉතිහාසය**, ඇම්.ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ.

සෙනෙවිරත්න අනුරාධ, (1994), **පුරාණ අනුරාධපුරය**, එස්.ගොඩගේ සහ සහෝදරයෝ. කොළඹ

හෙට්ටිආරච්චි, ඒ.එස්. (1986) ''අනුරාධපුර මහාසීමාව'' **Ancient Ceylon**, Department of Archaeology, Colombo

ෆාහියන්ගේ දේශාටන වාර්තාව, (1999) බලගල්ලේ, විමල්, ජී. (පරි) විසිදුණු ප්‍රකාශකයෝ බොරලැස්ගමුව.

Bandaranayaka. Senaka, (1974) **Sinhalese Monaestic Architecture**, E.J.Brill, Leiden.

Bell.H.C.P, (1929), **Epigraphia Zeylanica**, Vol I, Part I, Oxford University Press

Codrington, C.C.S., S.Paranavitana, (1929), **Epigraphia Zeylanica**,Vol III, Part II, Oxford University Press

Wickremasingha, D.M.Z., (1904-1912) **Epigraphia Zeylanica**,Vol I, Part I, Oxford University Press

Wickremasingha, D.M.Z., (1912) **Epigraphia Zeylanica,** Vol II, Part I, Oxford University Press

Wijesuriya. G. (1998) **Buddhist Meditation Monasteries of Ancient Sri Lanka**, Department of Archaeology, Sri Lanka

**සංස්කෘත සිංහල ශබ්ද කෝෂය**, (2004) පුවතිසි අලගියවන්න, සූරිය ප්‍රකාශකයෝ, කොළඹ 10

**ශ්‍රී සුමංගල ශබ්ද කෝෂය** (1994) සෝරත, වැලිවිටියේ (සංස්) එස්.ගොඩගේ සහ සහෝදරයෝ. කොළඹ

**සම්මුඛ සාකච්ඡා**

හෙට්ටිආරච්චි, කරුණාසේන, 2010, ඉතිහාස හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය.